මධ්‍යහ්නය ළං වුණත් වසන්ත සුළඟ මේපල් දළු පිහගෙන ගෙනාවෙ සිසිලක්. අලුත් සිතුවිලි අරගෙන හමා එන ඒ සුළඟට බඩගින්න ගසාගෙන ගිහින්. හිස් කෝපි කෝප්පය කුණු බක්කියට දැම්මේ ළඟම තිබුණ පදික වේදිකා බංකුවේ ඉඳගන්න බලාගෙන. මෙතෙක් වෙලා ඒ බංකුවේ වාඩිවෙලා වාදන විදපු වියපත් යුවල යන්න ගියේ බඩගිනි වෙලා වෙන්න ඕන.

මව් - දියණි වියෝලා - බේස් වයලින් වාදනයට අපූර්වත්වයක් එක් කළේ ඔවුන් ඒ රිද්මයට කළ සොඳුරු ළයාන්විත නර්තනය. ලාලන ලාලිත්‍යයට අභියෝග කරන වයස, හැඩරුව වගේ දේවල් මේ සියුමැලි නර්තන අබිමුවේ පළා ගිහින්.

වියෝලය තුරුළු කරගත්ත සුදු යුවතිය වෙනුවට ඇස් කෙවෙණි රිදවමින් මතුවෙන්නේ 'වීණා'. වයලින් වාද්‍ය විශාරද ප්‍රවීන් රසදේව සංගීතාචාර්යවරයාගේ එකම දුව, වීණා. අවුරුද්දක් හමාරක් බාල වුණත් තරුණයාත් එක්ක හරි හරියට වයලීනය ඉගෙනගන්න, පුහුණුවෙන්න හිටියේ වීණා. විසේකාර වීණාට වයලීනය පෙරදිග හුරුවට වගේම අපරදිග හුරුවටත් අගේට වයන්න පුළුවන්. විසේකාරකම් ඇයගේ වාදනයටත් මුසුවුණේ නොදැනී ම.

"නැට්ටිච්චියක් ද කොහෙද...!"

නංගී කිව්වෙ "රසාංජලී" කලායතනයේ වාර්ෂික ප්‍රසංග යේදී වීණා ඉදිරිපත් කරපු ඒකල වයලීන වාදනය දැකලා.

"පරිස්සමින් පුතේ..."

අම්මා කිව්වේ 'රසාංජලී' ප්‍රසංගයේ වීණාත් එක්ක කළ යුග වයලීන වාදනය දැකලා. කාන්තාවන්ට අනෙක් කාන්තාවන් ගැන තියෙන්නෙ පුදුම ඉවක්...!

මොනව වුණත් ඒ වෙනකොටත් ඒ "ඉවෙන්" ජීවිතයට ප්‍රයෝජනයක් ගන්න ප්‍රමාද වෙලා වැඩියි. ඒ වෙනකොට රසාංජලී කලායතනය ගෙදර වගේ වෙලා ඉවරයි.

සුදු මව දැන් බේස් වයලීනය මුවාවේ සියුම් රංගනයක.





සුදු පියාත්, පුතාත් වයලීනයත්, චෙලෝවත් එක්ක පදික වේදිකා ඔපෙරාවට එක්වෙලා. වයලින් පවුලක සර මිහිර "මවුන්ට් වේවර්ලි" කඩමණ්ඩියේ වා තලය ගිගුම් ගන්වනවා. ඒ අමන්දානන්දයෙන් හිත අතීත පෙම් ගුලාවේ ගුහාගත වෙනවා.

කලියුගයේ පංචශිඛයන් දැන් දියණිය තමන්ගේ දක්ෂම ශිෂ්‍යාට පවරා දෙන දිසාපාමොක් බවට පත්වෙලා. සංගීත මිහිරට මුසුව රහසේම ගලාගෙන ආ පෙම් රසෝඝයට අවහිරයක් වුණානම් ඒ අම්මාගේත්, නංගීගේත් නො මනාපය විතරයි. නංගීගේ විවාහයත්, අම්මාගේ අසනීප තත්ත්වයත් ඒ අතරට එක් වෙනවා. වීණාගේ පෙම් ආලකමන්දාවේ තේමා ගීතය තනුවක් ලෙසින් හිතට එන්නේ ඔය කාලයෙදි. ඒත් ඒ තනුව කෙනෙකුට වාදනය කරලා පෙන්නන්න තරම් දෙයක් තිබුණාද කියලා ඒ කාලෙ හිතුණා. ඒ නිසාමයි ඒ තනුව ස්වර සටහනකට විතරක් සීර වෙන්නෙ.

"මාරයිනෙ මචං...!" ඒ තමයි ජයසේකර ගෙදර ආව වෙලාවක තනුව අහලා දුන්න සහතිකය.

"ඕක එළියට දාපන්... ගෙයි මුල්ලෙ තියන් ඉන්නෙ නැතිව!" ජයශේකර උනන්දුයි.

"එහෙම අමු අමුවේ 'රෝ' විදියට වැඩක් එළියට දාන්න බෑ බං..."

"ඇයි ඉතින් උඹ ඕක පෙන්නන්නැත්තෙ උඹේ මාස්ටර්කාරයාට...? අනාගත බෑණන්ඩියට උදව් නොකර ඉන්න එකක් නෑ..." ජයසේකරට නම් හිනා.

"මොනවා වුණත් හොඳ අයිඩියා එකක්...!"

* * * * *